**සුරාබදු ආඥාපනත**

**අංක 08/2018 දරන සුරාබදු නිවේදනය**

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 32 වන වගන්තිය සමඟ කියවනු ලබන 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් 2018 අප්‍රේල් 16 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත දැක්වෙන පරිදි ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 අප්‍රෙල් 06 වැනි දින,

කොළඹ 01,

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**ගස් මැදීමේ බලපත්‍ර ගාස්තු**

| | සමුපකාර ක්‍රමය යටතේ (රු.) | සමුපකාර ක්‍රමය යටතේ නොවන (රු.) |
|---|---|---|
| I. පිරිමි තල් (ගසකට) | 10.00 | 25.00 |
| II. ගැහැණු තල් (ගසකට) | 25.00 | 50.00 |
| III. පොල් (ගසකට) | 25.00 | 50.00 |

2.
   I. මීරා සඳහා පොල් ගස් මැදීමේ ගෘහස්ථ බලපත්‍රය (ගසකට) : රු. 50.00
   II. මීරා සඳහා පොල් ගස් මැදීමේ වාණිජ බලපත්‍රය (ගසකට) : රු. 100.00

3. අර්ථ නිරූපණය : “සමුපකාර ක්‍රමය යටතේ” යන්න පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති හෝ සංගම් අදහස් වේ.